# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,991—1971 දෙසැම්බර් 30 වැනි බ්‍රහස්පතින්ද—1971.12.30

(ලංකාණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... | 1157 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 1155 | මිළ පාලන දැන්වීම් ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... | 1156 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... | 1173 |
| | | " සුරුබුදු ආඥාපනත " පිළිබඳ දැන්වීම් | |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

1971 අංක 399

අංකය : ඩී. 250/ආර්සීටී/ 3.

### යුද්ධ හමුදව—ස්ථිර බල හමුදව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා 1970 නොවැම්බර් මස 17 වැනි දින සිට මේජර් වශයෙන් :—

කපිතන් (තාවකාලික මේජර්) ආරියරත්න ආරියප්පෙරුම, ගැහේබ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ආ. රා. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1971 දෙසැම්බර් මස 15 දින,
කොළඹදිය.

12-1165

1971 අංක 400

අංකය : ඩී. 342/ආර්සීටී.

### යුද්ධ හමුදව—ස්ථිර බල හමුදව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද ස්ථිර බල හමුදවේ සේවය නිම කිරීම

පහත නම සඳහන් නිලධාරියා 1971 ඔක්තෝබර් මස 31 වැනි දින සිට ස්ථිර බල හමුදාවේ සේවය නිම කළේය :—

කපිතන් බර්ට්‍රම් එඩ්වර්ඩ් දේවේන්ද්‍ර විජේන්ද්‍ර, ලං.කා.භ. (විශ්‍රාමලත්).

උතුමානන් වහන්සේගේ අණපරිදි,

ආ. රා. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1971 දෙසැම්බර් 17 දින,
කොළඹදිය.

12-1164

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

එල්. ඩබ්ලිව්. ඩී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 ජූනි 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
කොළඹ

1971 අංක 407

## නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)

කටුවලවත්තෙ ලියනගේ රොබට් නන්දශ්‍රී පෙරේරා මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1971 ක්‍රි දෙසැම්බර් මස 20 වැනි දින,
කොළඹ දිය.

12–1296

1971 අංක 408

## නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)

අබ්දුල්කරීමාලිම් මොහමඩ් නූර්දීන් මහතා මඩකළපුව අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1971 ක්‍රි දෙසැම්බර් මස 20 වැනි දින,
කොළඹ දිය.

12–1297

---

# ආණ්ඩුවේ නිවේදන

## 1968 අංක 32 දරණ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත

1968 අංක 32 දරණ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනතේ 52 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අග්‍රාමාත්‍ය හා රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති විසින් පනවනු ලැබ, එම වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ නියෝග.

ආ. රා. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1971 දෙසැම්බර් 16 දින,
කොළඹ දිය.
ඇල්. ඩී.—ඩී. 2/71.

### 1968 අංක 32 දරණ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත

1968 අංක 32 දරණ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනතේ 52 වැනි වගන්තිය යටතේ අගමැති සහ රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති විසින් පනවනු ලැබ, එම වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ නියෝග.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
අගමැති සහ රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති.

1971 ඔක්තෝබර් 8 දින,
කොළඹ දිය.

### නියෝග

1. මෙම නියෝග 1971, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ නියෝග යනුවෙන් හැඳින්විය හැක.

2. පනතේ 6 වැනි වගන්තියේ කාර්යයන් සඳහා පුද්ගලයන්ගේ ලේඛනය මෙහි වූ උපලේඛනයේ දක්වෙන "අ" ආකෘති පත්‍රය පරිදිම විය යුතුය.

3. (1) නියමිත දිනයෙහි හෝ ඊට පසුව ලංකාවට ඇතුළු වන්නා වූ ද පනත යටතේ ලියා පදිංචි වීමට යටත් වන්නා වූ ද තැනැත්තෙකු විසින් ඔහු දිවයිනට ඇතුළු වූ දින සිට මාස හයක් ඇතුළත ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කළ යුතුය.

(2) පනතේ 2 (2) වැනි වගන්තිය අනුව ලියාපදිංචි වීමට යටත් නොවන්නා වූ ද, අනතුරුව එසේ ලියාපදිංචි වීමට යටත් වන්නා වූ ද, තැනැත්තෙකු විසින් එසේ ලියාපදිංචි වීමට යටත්වන්නා වූ දින සිට මාස හයක් ඇතුළත ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කළ යුතුය.

(3) පනතේ 7 (1) වැනි වගන්තිය යටතේ ඇමැතිවරයා විසින් නිකුත් කරන ලද ආඥාව ප්‍රසිද්ධ කළ දිනට පසු වයස අවුරුදු දහඅට ලබන්නා වූ ද, පනත යටතේ ලියාපදිංචි වීමට යටත්වන්නා වූ ද, සැම තැනැත්තකු විසින් ම තමාට වයස අවුරුදු දහ අට ලැබූ දින සිට එක් අවුරුද්දක් ඇතුළත ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කළ යුතුය.

4. (1) පනතේ 9 වැනි වගන්තියේ කාර්යයන් සඳහා පනත යටතේ ලියාපදිංචි වීම සඳහා වූ සැම ඉල්ලුම් පතක් ම මෙහි වූ උපලේඛනයෙහි දක්වෙන "ආ" ආකෘති පත්‍රයෙහිම වියයුතු අතර එහි සඳහන් කරුණු පිළිබඳ විස්තර අඩංගු විය යුතුවාක් මෙන් ම ගාස්තුවක් ගෙවීමෙන් තමා නිදහස් කළ බවට සහතිකයක් අයදුම්කරු නොදරන්නේ නම් ඇමතිවරයා විසින් නියම කරනු ලැබ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන වටිනාකමකින් යුතු මුද්දරයක් හෝ මුද්දර, ගාස්තු වශයෙන් අයදුම් පතට ඇලවිය යුතුය.

(2) පනතේ 9 (2) (ඉ) වගන්තියේ කාර්යයන් සඳහා පිටසන, මෙහි වූ උපලේඛනයෙහි දක්වා ඇති "ඇ" ආකෘති පත්‍රයෙහි ම විය යුතුය.

5. පනතේ 14 (අ) වැනි වගන්තියේ කාර්යයන් සඳහා හැඳුනුම් පත මෙහි වූ උපලේඛනයේ "ඈ" ආකෘති පත්‍රයෙහි ම විය යුතුය.

6. පනතේ 15 වැනි වගන්තියේ කාර්යයන් සඳහා පහත සඳහන් අය නියමිත නිලධාරීන් විය යුතුය :—

(අ) යම් පරිපාලන දිස්ත්‍රික්කයක රජයේ දිසාපතිවරයා,

(ආ) රජයේ අතිරේක දිසාපතිවරයෙක්,

(ඇ) රජයේ සහකාර දිසාපතිවරයෙක්,

(ඈ) රජයේ අතිරේක සහකාර දිසාපතිවරයෙක්,

(ඉ) රජයේ දිසාපතිවරයාගේ කාර්යාල සහකාරවරයෙක්,

(ඊ) රජයේ දිසාපතිවරයාගේ අතිරේක කාර්යාල සහකාරවරයෙක්,

(උ) ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරී,

(ඌ) ග්‍රාම සේවකයෙක්,

(එ) කම්කරු කොමසාරිස්වරයා,

(ඒ) නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයෙක්,

(ඔ) සහකාර කම්කරු කොමසාරිස්වරයෙක්,

(ඕ) කම්කරු නිලධාරියෙක්,

(ක) ආගමන හා විගමන පනතේ 7 (අ) (1) වැනි වගන්තිය යටතේ හමුදාවේ බලය ලත් සාමාජිකයෙකු වශයෙන් පදවි නාම ලත් යුද්ධ හමුදාවේ සාමාජිකයෙක්, හෝ රාජකීය ලංකා නාවික හමුදාවේ හෝ රාජකීය ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයෙක්,

(ග) ආගමන හා විගමන පනතේ 4 (1) වැනි වගන්තිය යටතේ පත් කරන ලද බලය ලත් නිලධාරියෙක්,

(ජ) තුමන තරාතිරමක හෝ පොලිස් නිලධාරියෙක්, සහ

(ට) සාම නිලධාරියෙක්.

7. පනතේ 16 (2) (අ) වැනි වගන්තියේ කාර්යයන් සඳහා හැඳුනුම් පතක අනුපිටපතක් සඳහා කරනු ලබන සෑම ඉල්ලීමක් ම මෙහි වූ උපලේඛනයේ දක්වෙන " ඉ " ආකෘති පත්‍රය පරිදිම විය යුතුය.

8. පනතේ 17 (2) (අ) වැනි වගන්තියේ කාර්යයන් සඳහා හැඳුනුම් පතක අනුපිටපතක් සඳහා කරනු ලබන සෑම ඉල්ලීමක් ම මෙහි වූ උපලේඛනයේ " ඊ " ආකෘති පත්‍රය පරිදි ම විය යුතුය.

9. පනතේ 18 (1) (ආ) වැනි වගන්තියේ කාර්යයන් සඳහා මුල් හැඳුනුම් පත වෙනුවට එහි අනුපිටපතක් නිකුත් කරනු ලැබ ඇති විට අවලංගු කිරීම සඳහා මුල් හැඳුනුම් පත කොමසාරිස්වරයා වෙත ආපසු එවීම මුල් හැඳුනුම් පත සම්භවූ දින සිට සතියක් ඇතුලත කළ යුතුය.

10. පනතේ 19 (2) වැනි වගන්තියේ කාර්යයන් සඳහා හැඳුනුම් පතක් දරන්නෙකු හය මාසයකට වැඩි කාල පරිච්ඡේදයක් පිටරට නැවතීම පිණිස ලංකාවෙන් පිට වී යන විට එම හැඳුනුම් පත ඒ වන විටත් කොමසාරිස්වරයා වෙත බාර දී නොමැති නම් නික්ම යන වරායේ දී හෝ තොටුපලේ දී ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලය ලත් නිලධාරියෙකුට භාර දිය යුතුය.

11. පනතේ 9 (3) වැනි වගන්තියේ කාර්යයන් සඳහා අවශ්‍ය ඡායාරූපය එම කාර්යය සඳහා කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කර ඇති ඡායාරූප ශිල්පියෙකු විසින් ගත යුතු වේ.

12. එබඳු සෑම ඡායාරූපයක් ම පහත දක්වෙන දිග පළලින්, විස්තර වලින්, ප්‍රමිතයන්ගෙන් සහ තත්ත්වයෙන් යුත් එකක් විය යුතුය.

(අ) ඡායාරූපයේ ප්‍රමාණය වට තීරුව රහිතව දිගින්, අඟල් එකයි, අඟලෙන් අටෙන් තුනක් ද, පළලින්, අඟලින් අටෙන් හතකට නොඅඩුව ද, අඟලකට නොවැඩිව ද වියයුතු අතර ඡායාරූප පිටපත එම ප්‍රමාණයෙන් ම විය යුතුය.

(ආ) ඡායාරූපය පෙන්නුම් කරන තැනැත්තාගේ මුහුණ සහ උරහිස් අර්ධ අංශව පෙනෙන සේ ඡායාරූපයේ තිබිය යුතුය.

(ඇ) ඡායාරූපයෙන් පෙන්නුම් කරන තැනැත්තාගේ හිස ඡායාරූපයේ (අඟල් එකයි, අඟලින් අටෙන් තුනක ප්‍රමාණයෙහි) උස් අතට පෙන්නුම් කරන අයුරින් සහ එම තැනැත්තාගේ පින්තූරය ඡායාරූපයේ මැද දක්වෙන අයුරින් ද ඡායාරූපය ගත යුතුය.

(ඈ) ඡායාරූපය මධ්‍යස්ථ අඳුරු පැහැති පසුතලයක ගතයුතු අතර, ඡායාරූපයට ලක්වන තැනැත්තාගේ මුහුණෙහි විශේෂ ලක්ෂණ කැපී පෙනෙන සේ ආලෝකය පාවිච්චි කළ යුතුය.

(ඉ) ඡායාරූපය සුදු සහ කළු වර්ණයෙන් නිම කළ යුතුය.

(ඊ) ඡායාරූපය හෝ ඡායාරූප පිටපත් ප්‍රමාලේපණය කිරීම, වර්ණ කිරීම හෝ සැකසීම නොකළ යුතුය.

(උ) ඡායාරූපය කෙළින්ම ප්‍රතිඡායාවෙන් ගන්නා ලද ස්පර්ශ සේයා පිටපතක් විය යුතුය.

(ඌ) ඡායාරූප පිටපත් තියුණු සහ පැහැදිලි විය යුතුය. (නොපැහැදිලි හෝ නියම අයුරින් යොමු නොවූ පින්තූර පිළිගනු නොලැබේ.)

(එ) ඡායාරූප පිටපත අඩු ගණනේ අවුරුදු දහයක කාලයක් පවතින සේ නිම කළ යුතුය.

(ඒ) මෙම කාර්ය සඳහා සුදුසුයයි කොමසාරිස්වරයා විසින් අනුමත කරණු ලබන යම් වර්ගයක, ප්‍රමාණයක හා තත්ත්වයක සේයාපටි සහ ද්‍රව්‍යයන් පමණක් පාවිච්චි කළ යුතුය.

13. වෘත්තියෙන් ඡායාරූප ශිල්පියකු වන—

(අ) මැදිරි ඡායාරූප ශිල්පය සම්බන්ධයෙන් අවුරුදු පහක පළපුරුද්දක් ඇති රාජකීය ඡායාරූප ශිල්පීන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකයකු හෝ බ්‍රිතාන්‍ය ඡායාරූප ශිල්පීන්ගේ ආයතනයේ සාමාජිකයෙකු හෝ ලංකා රජයේ කලා ශිල්ප විද්‍යාලයේ ඡායාරූප ශිල්පය පිළිබඳව ඩිප්ලෝමාව දරන්නෙකු වන යම් තැනැත්තෙකුට, හෝ

(ආ) මැදිරි ඡායාරූප ශිල්පය සම්බන්ධයෙන් අවුරුදු දහයක පළපුරුද්දක් තිබෙන යම් තැනැත්තෙකුට—

මේ පනත යටතේ ලියාපදිංචි කිරීම සහ හැඳුනුම් පත් නිකුත් කිරීම පිණිස, අයදුම්කරුවන්ගේ ඡායාරූප ගැනීමේ කාර්යය සඳහා ඡායාරූප ශිල්පියකු ලෙස ලියාපදිංචි වීම පිණිස කොමසාරිස්වරයා වෙත ඉල්ලුම් කළ හැකිය.

14. කොමසාරිස්වරයාට සිය පරම අභිමතය පරිදි ලියාපදිංචි වීම සඳහා අයදුම් කරන ඡායාරූප ශිල්පියෙකු ලියාපදිංචි කිරීම හෝ ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂෙප කිරීම හෝ කළ හැක.

15. (1) ඡායාරූප ශිල්පියෙකු ලියාපදිංචි කිරීමට පෙර ලියාපදිංචි කිරීමේදී යටත් කරනු ලබන යම් කොන්දේසි සහ නියමයන් සපුරාලන බවට ඇපයක් තබන ලෙස කොමසාරිස්වරයා විසින් ඔහුට නියම කළ හැකිය.

(2) එම ඇපය සැපයීම කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන ප්‍රමාණයක මුදලක් දිසාපතිවරයා වෙත තැන්පත් කිරීමෙන් හෝ, එබඳු මුදලක් ගෙවීම සඳහා බැඳුම්කරයක් ලියා අත්සන් කිරීමෙන් හෝ එබඳු වටිනාකමක් ඇති නිශ්චල දේපොළක් උකස් කිරීමෙන් හෝ කළ යුතුය.

(3) ඡායාරූප ශිල්පියෙකු ලියාපදිංචි කිරීමේ දී ඇති කර ගන්නා වූ යම් කොන්දේසියක් හෝ නියමයක් කඩකිරීමේ දී හෝ පැහැර හැරීමේදී කොමසාරිස්වරයා විසින් තීරණය කළ හැකි පරිදි තැන්පත් කරන ලද ඇප මුදලින් කොටසක් හෝ සම්පූර්ණ ප්‍රමාණය රාජසන්තක කළ යුතුය.

16. පනත යටතේ යම් තැනැත්තෙකු ඡායාරූප ශිල්පියෙකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා ගාස්තුව රුපියල් පහක් විය යුතුය.

17. පනත යටතේ ඡායාරූප ශිල්පියකු ලෙස ලියාපදිංචි කරන ලද සෑම තැනැත්තෙකුටම " උ " උපලේඛනයෙහි දක්වා ඇති ආකෘති පත්‍රයෙහි ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කළ යුතුය.

18. පනත යටතේ ලියාපදිංචි වීම සඳහා අයදුම් කරන සෑම තැනැත්තෙකු විසින් ම සිය අයදුම්පතට යාකර ඉදිරිපත් කිරීමට අවශ්‍ය ඡායාරූපයන් ගැනීමේ කාර්යය සඳහා ලියාපදිංචි වූ ඡායාරූප ශිල්පියෙකුට භාරදීම පිණිස සිය ප්‍රදේශයේ සහතික කිරීමේ නිලධාරියාගෙන් බලය පැවරීමේ ලිපියක් ලබා ගත යුතුය.

19. ලියාපදිංචි වූ ඡායාරූප ශිල්පියෙකු විසින් තමා වෙත 18 වැනි නියෝගය යටතේ බලය පැවරීමේ ලිපියක් ඉදිරිපත් කරන අයදුම්කරුවෙකුගේ ඡායාරූපය ගතයුතු අතර තමා විසින් ගන්නා ලද ඡායාරූපයේ පිටපත් තුනක් එම අයදුම්කරු වෙත බාර දිය යුතුය.

20. පනතේ 12 වැනි හෝ 20 වැනි වගන්තිය යටතේ සෑම අභියාචනාවක් ම නියමිත විනිශ්චය මණ්ඩලයකට යැවීම සඳහා කොමසාරිස්වරයාට ඉදිරිපත් කළ යුතුය.

21. මෙම නියෝගවල—

" පනත " යනුවෙන් 1968 අංක 32 දරණ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත අදහස් වන අතර, " කොමසාරිස්වරයා " යන්නෙන් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් අදහස් වේ.

## " අ " ආකෘති පත්‍රය

දිස්ත්‍රික්කය :..........................................

| ලියාපදිංචි කිරීමේ කිරීමේ සහ හැඳින්වීම් පතෙහි අංකය | නම | වෙනත් නම් | වයස | ස්ත්‍රී පුරුෂ භාවය | ගෘහමූලික හෝ වරිපනම් අංකය | ග්‍රාම සේවක කොට්ඨාශය හෝ ප්‍රාදේශිය බලමණ්ඩලයෙහි කොට්ඨාශය හා වීදිය | ප්‍රාදේශිය ආදයම් නිලධාරිගේ කොට්ඨාශය | අයදුම්පත් අංකය | මාණ්ඩලික නිලධාරියාගේ අත්සන සහ දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

## " ආ " ආකෘති පත්‍රය

**1968 අංක 32 දරණ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත**

යොමු අංකය :..................

## පනතේ 9 වැනි වගන්තිය යටතේ ලියාපදිංචිවීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය

1. ............ වන මම, පනතේ 11 වන වගන්තිය යටතේ ලියාපදිංචිවීම සඳහාත්, 14 වන වගන්තිය යටතේ හැඳුනුම් පතක් නිකුත් කරනු ලැබීම සඳහාත්, 1968 අංක 32 දරණ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 9 වන වගන්තිය යටතේ මෙයින් ඉල්ලුම් කරමි.

2. මෙම ඉල්ලුම් පත්‍රයට පෙරාතුව වෙනත් ඉල්ලුම් පත්‍රයක් මම ඉදිරිපත් කර නැත්තෙමි.

3. මම ලියාපදිංචි වීමට යටත් වෙන තැනැත්තෙක් වෙමි.

4. මම මගේ ඡායාරූපයෙන් පිටපත් 3 ක් මෙහි ඇතුළත් කරමි.

5. පහත දක්වෙන විස්තර මා හොඳින් දන්නා පරිදි හා විශ්වාස කරන අන්දමට සත්‍ය හා නිවැරදි බවට මෙයින් මම ප්‍රකාශ කරමි.

———,
අයදුම්කරුගේ අත්සන හෝ වම් මාපට ඇඟිලි සලකුණ.

දිනය :............

### විස්තර

1. (අ) සම්පූර්ණ නම :———. (ආ) ස්ත්‍රී පුරුෂ භාවය : ස්ත්‍රී/පුරුෂ
2. වෙනත් නම් :———.
3. පියාගේ නම :———.
4. උපත :———. (අ) දිනය :——— අවුරුද්ද මාසය දිනය (ආ) වයස :———. අවුරුදු (ඇ) ස්ථානය :———. ගම/නගරය දිස්ත්‍රික්කය
5. ලිපිනය :———. (අ) ගෘහමූලික හෝ වරිපනම් අංකය :———. (ආ) ග්‍රාමසේවක කොට්ඨාශය හෝ ප්‍රාදේශිය බලමණ්ඩලයෙහි කොට්ඨාශය හා වීදිය :———. (ඇ) ප්‍රාදේශිය ආදයම් නිලධාරි කොට්ඨාශය :———.
6. රක්ෂාව :———. (අ) ස්වභාවය :———. (ආ) රක්ෂාව කරන ස්ථානයේ ලිපිනය :———.
7. වෙනත් පදිංචි ස්ථානයක් වේනම්, විස්තර :———.
   (අ) ගෘහමූලික හෝ වරිපනම් අංකය :———.
   (ආ) ග්‍රාමසේවක කොට්ඨාශය හෝ ප්‍රාදේශිය බල මණ්ඩලයෙහි කොට්ඨාශය හා විදිය :———.
   (ඇ) ප්‍රාදේශිය ආදයම් නිලධාරි කොට්ඨාශය :———.
   දිස්ත්‍රික්කය :———.
8. (i) ඡන්ද දායකයෙකු වශයෙන් ලියාපදිංචිය පිළිබඳ විස්තර :———.
   (අ) මැතිවරණ දිස්ත්‍රික්කය සහ අංකය :———.
   (ආ) ඡන්ද කොට්ඨාශය :———.
   (ඇ) ලේඛනයෙහි ඡන්ද දායකයාගේ අනුක්‍රමික අංකය :———.

   (ii) ඡන්ද දායකයෙකු නොවන අය :———.

   මා ඡන්ද දායකයෙකු වශයෙන් ලියාපදිංචිවී නැත. මෙම අයදුම්පතට යාකොට ඇති " අ " සහ " ආ " ඇමිණුම්වල මගේ පදිංචිය සහ රක්ෂාව පිළිබඳ විස්තර සපයා ඇත.
9. විවාහක තත්වය :———.
   (අ) විවාහක/අවිවාහක :———.
   (ආ) භාර්යාවගේ හෝ ස්වාමිපුරුෂයාගේ නම :———.
   ඡායාරූපය :———.
10. මුද්දර :———.

### සහතික කිරීමේ නිලධාරියාගේ සහතිකය

මෙම අයදුම් පතෙහි අලවා ඇති ඡායාරූපයද, මෙම අයදුම් පතට යාකර ඇති ඡායාරූපයේ පසුපිටෙහි අංක ........... දරණ ඡායාරූප පිටපත් දෙක ද, මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති ........... ගේ ඡායාරූපය බව මම මෙයින් සහතික කරමි.

———,
සහතික කිරීමේ නිලධාරියාගේ අත්සන.

දිනය :———.
සහතික කිරීමේ නිලධාරියාගේ නම :———.
සහතික කිරීමේ නිලධාරියාගේ ලිපිනය :———.

## ඇමිනිම " අ "

(1949.11.1 වැනි දින සිට ඔබ ලංකාවෙහි පදිංචිව සිටි ස්ථාන හා උපන් දිනය හෝ ලංකාවට පැමිණි දිනය යන මේ දෙකින් පසුව එළඹෙන දිනය සඳහන් කරන්න. ඔබ මාස තුනකට අඩු කාලයක් පදිංචිව සිටි ස්ථාන සඳහන් කිරීමට උවමනා නැත.)

| ලංකාවෙහි පදිංචිව සිටි ස්ථානවල ලිපිනය | ඔබ එක් එක් ස්ථානයෙහි පදිංචිව සිටි කාල පරිච්ඡේදයන් | |
|---|---|---|
| | සිට | දක්වා |
| | | |

## ඇමිනිම " ආ "

(1949.11.1 වැනි දින සිට හෝ ලංකාවෙහි දී පළමුවෙන් රැකියාවක යෙදුන දින සිට හෝ යන මෙයින් පසුව යෙදුනු දින සිට එක් එක් සේවා යොජකයාගේ නම් සහ ලිපිනයන් සඳහන් කරන්න.)

| එක් එක් සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | එක් එක් ස්ථානයේ රැකියාවේ යෙදුනු කාල පරිච්ඡේද | | රැකියාවේ ස්වභාවය |
|---|---|---|---|
| | සිට | දක්වා | |
| | | | |

## " ඇ " ආකෘති පත්‍රය

### සහතික කිරීමේ නිලධාරියාගේ සහතිකය

මෙම අයදුම් පත්‍රයෙහි අලවා ඇති ඡායාරූපය ද, මෙම අයදුම් පතට යාකර ඇති ඡායාරූපයේ පසුපිටෙ අංක ………… දරණ ඡායාරූප පිටපත් දෙක ද මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති ………… ගේ ඡායාරූපය බව මම මෙයින් සහතික කරමි.


දිනය :————.

සහතික කිරීමේ නිලධාරියාගේ නම :————.

සහතික කිරීමේ නිලධාරියාගේ ලිපිනය :————.

————,
සහතික කිරීමේ නිලධාරියාගේ අත්සන.

## " ඇ " ආකෘති පත්‍රය



## " ඉ " ආකෘති පත්‍රය

### හැඳුනුම්පතක අනුපිටපතක් සඳහා වූ අයදුම්පත

1. ............ වන මම, හැඳුනුම් පතක අනුපිටපතක් සඳහා 1968 අංක 32 දරණ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනතේ 16 වන වගන්තිය යටතේ ඉල්ලුම් කරමි.

2. අනුපිටපත් කාඩ්පත නිකුත් කිරීමේ ගාස්තු වශයෙන් රු. ............ ක් වටිනාකමින් යුත් මුද්දර මෙහි බහා එවමි.

3. මගේ ඡායාරූපයේ පිටපත් තුනක් මෙහි බහා එවමි.

4. මගේ මුල් කාඩ්පත නැතිවූ බව දනුම් දෙනු ලැබූ පොලිස් ස්ථානයේ තොරතුරු පොතෙන් ලබාගත් අදාළ උද්ධෘතයේ සහතික කළ පිටපතක් මෙහි බහා එවමි.

5. මා ලියාපදිංචිවී ඇති අතර මා අතින් නැති වූ හැඳුනුම්පතේ අංකය ............ වේ.

———,
අයදුම්කරුගේ අත්සන හෝ වම් මාපට ඇඟිලි සලකුණ.

දිනය :———.
ලිපිනය :———.

| මුද්දර | ඡායාරූපය |
|---|---|

### සහතික කිරීමේ නිලධාරියාගේ සහතිකය

මෙම අයදුම් පතෙහි අලවා ඇති ඡායාරූපය ද, මෙම අයදුම් පතට යාකර ඇති ඡායාරූපයේ පසු පිටේ අංක ............ දරණ ඡායාරූප පිටපත් දෙක ද, මෙම අයදුම් පත ඉදිරිපත් කර ඇති ............ ගේ ඡායාරූපය බව මම මෙයින් සහතික කරමි.

———,
සහතික කිරීමේ නිලධාරියාගේ අත්සන.

දිනය :———.
සහතික කිරීමේ නිලධාරියාගේ නම :———.
සහතික කිරීමේ නිලධාරියාගේ ලිපිනය :———.

### පොලිස් සහතිකය

............ විසින් තම හැඳුනුම් පත නැති වූ බව ............ දින මෙම ස්ථානයට දනුම්දුන් අතර එම හැඳුනුම් පත මෙතෙක් ඔහුට/ඇයට ලැබී හෝ ඔහු/ඇය විසින් සොයා ගෙන හෝ නොමැති බව ............ පොලිස් ස්ථානයේ ස්ථාන භාර පොලිස් නිලධාරි ............ වන මම මෙයින් සහතික කරමි.

———,
ස්ථාන භාර නිලධාරියාගේ අත්සන.
පොලිස් ස්ථානය :———.

දිනය :———.
නිලධාරියාගේ නම :———.
ලිපිනය :———.

## " ඊ " ආකෘති පත්‍රය

### හැඳුනුම්පතක අනුපිටපතක් සඳහා වූ අයදුම්පත

1. ............ වන මම, මගේ හැඳුනුම්පත පලුදුවී/අවලක්ෂණවී/නොපැහැදිලිවී/නොපැහැදිලි වීමට ඉඩ ඇති නිසා, පනතේ 17 වැනි වගන්තිය යටතේ හැඳුනුම් පත් අනුපිටපතක් සඳහා මෙයින් ඉල්ලුම් කරමි.

2. 1 වැනි ඡේදයෙහි සඳහන් අංක ............ දරණ මගේ හැඳුනුම්පත මෙහි බහා එවමි.

3. මගේ ඡායාරූපයේ පිටපත් තුනක් මෙහි බහා එවමි.

4. අනුපිටපත නිකුත් කිරීමේ ගාස්තු වශයෙන් රු. ............ ක වටිනාකමින් යුත් මුද්දර මෙහි බහා එවමි.

———,
අයදුම්කරුගේ අත්සන/වම් මාපට ඇඟිලි සලකුණ.

දිනය :———.
ලිපිනය :———.

| මුද්දර | ඡායාරූපය |
|---|---|

### සහතික කිරීමේ නිලධාරියාගේ සහතිකය

මෙම අයදුම් පතෙහි අලවා ඇති ඡායාරූපය ද, මෙම අයදුම් පතට යාකර ඇති ඡායාරූපයේ පසු පිටේ අංක ............ දරණ ඡායාරූප පිටපත් දෙක ද, මෙම අයදුම් පත ඉදිරිපත් කර ඇති ............ ගේ ඡායාරූපය බව මම මෙයින් සහතික කරමි.

———,
සහතික කිරීමේ නිලධාරියාගේ අත්සන.

දිනය :———.
සහතික කිරීමේ නිලධාරියාගේ නම :———,
සහතික කිරීමේ නිලධාරියාගේ ලිපිනය :———.

## " උ " ආකෘති පත්‍රය

### ඡායාරූප ශිල්පියකු වශයෙන් ලියාපදිංචි කිරීමේ සහතිකය

### පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත

### 1968 අංක 32 දරණ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත

මෙහි පහත විස්තර කර ඇති තැනැත්තා 1968 අංක 32 දරණ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ඡායාරූප ශිල්පියෙකු වශයෙන් ලියාපදිංචි කොට ඇති බව මම මෙයින් සහතික කරමි.

(i) නම :———.

(ii) ලිපිනය :———.

(iii) ව්‍යාපාර කටයුතු කරන ප්‍රධාන ස්ථානය :———.
(ඡායාරූප ශාලාව පිහිටි ස්ථානය)

(iv) (ව්‍යාපාර නාම ආඥපනතේ 149 වැනි අධිකාරය යටතේ) ව්‍යාපාරයක් වශයෙන් ලියාපදිංචිවී තිබේ නම් :—
(අ) අංකය :———.
(ආ) දිනය :———.
(ඇ) එම ලියාපදිංචි කිරීම නිකුත් කළ බලධාරියා :———.

(v) පනත යටතේ ඡායාරූප ගැනීමේ කාර්‍ය්‍ය සඳහා ලියාපදිංචි වූ ඡායාරූප ශිල්පියාට ඡායාරූප ගැනීමට බලය පවරා ඇති දිස්ත්‍රික්කය හෝ දිස්ත්‍රික්ක :———.

———,
පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්.

දිනය :———.
කොළඹ.
12-1057

2023
01 13

20.23 ජනවාරි මස.13 වෙනි දින
... 07, පිලිප් ගුණවර්ධන මාවතේ
... නාරක්ෂක දෙපාර්තමේන්තුවේ දිය.
... 8/1 .12.48.2023

1971/11/30 දිනැති අංක 14,991 දරන
ගැසට් පත්‍රයේ I (I)
1155, 1157 සිට 1161 දක්වා පිටුවේ/පිටුවල
... සත්‍ය ඡායා පිටපතකි.

ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

එම්.ඒ. මහින්ද ධර්මසිරි
ජ්‍යෙෂ්ඨ ලේඛනාරක්ෂක (රා.ආ.)
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
නො.07. පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.